**තණමල්විල ප්‍රාදේශීය සභාව**
**මොනරාගල දිස්ත්‍රික්කය**
**------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 21 දින විගණනයට ඉදිරිපත්කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජුනි 20 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට තණමල්විල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) සභාව විසින් බුක්තිවිඳින ඉඩම් කැබලි 25ක් තක්සේරුකර ගිණුම්ගතකිරීමට කටයුතුකර නොතිබුණි.

(ආ) සභාව සතු ගොඩනැගිලි 48ක වටිනාකම ගිණුම්ගතකර නොතිබුණි.

(ඇ) පුරනැගුම ව්‍යාපෘතිය මගින් සමාලෝචිත වර්ෂයේදී ඉටුකර තිබුණු රු.31,508,354ක ඉදිකිරීම් ප්‍රාග්ධනිතකර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගන්නා ලද රු.608,035ක යන්ත්‍රෝපකරණ 02ක් ප්‍රාග්ධනිතකර නොතිබුණි.

(ඉ) සභා ගොඩනැගිල්ල සඳහා සමාලෝචිත වර්ෂයේදී කළ රු.367,160ක සවිකිරීම් ප්‍රාග්ධනිතකර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී ඉදිකළ එකතුව රු.1,781,547ක් වූ ප්‍රාදේශීය සභා රථගාල, නව කාර්යාලයේ දැල් වැට සහ ලේඛනාගාර රාක්ක ප්‍රාග්ධනිතකර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සෙවනගල සනඅපද්‍රව්‍ය ව්‍යාපෘතිය සඳහා ගෙවිය යුතු මුදල රු.339,734ක් වුවත් රු.1,114,734ක් වශයෙන් ගිණුම්ගතකිරීම නිසා රු. 775,000ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) තණමල්විල යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය වටා කම්බි වැට ඉදිකිරීමේ කර්මාන්තයට අදාල රු.198,024ක අතරුදවුම් මුදල තැන්පත් ගිණුමට බැරකර නැවත කර්මාන්ත ණයහිමි යටතේද ගිණුම්ගතකර තිබීම නිසා එම වටිනාකමින් කර්මාන්ත ණයහිමියෝ වැඩියෙන් හා අතිරික්තය අඩුවෙන් දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.139,922ක් වැඩියෙන් ගිණුම්ගතකර තිබීම නිසා ලැබිය යුතු මුද්දර ගාස්තු සහ ආදායම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.131,310ක ගෙවිය යුතු වියදම් ගිණුම්ගතකර නොතිබීම නිසා එම වටිනාකමින් වර්ෂයේ වියදම් හා ණයහිමියෝ අඩුවෙන් දක්වා තිබුණි.

### 1.3.2 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

<u>ගෙවිය යුතු ගිණුම්</u>

(i) සමාලෝචිත වර්ෂයට අදාල මුද්දර බදු රු.209,287ක් දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කිරීමට කටයුතුකර නොතිබුණි.

(ii) මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය මිලදී ගැනීමට දේශීය ණය සහ සංවර්ධන අරමුදලෙන් ලබාගත් රු.10,000,000ක ණය මුදල වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාල රු.2,321,083ක ණය වාරික ගෙවීමට කටයුතුකර නොතිබුණි.

### 1.3.3 <u>විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම</u>

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.14,532,681ක වත්කම් විෂයයන් 03ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

### 1.3.4 <u>අනුකූල නොවීම්</u>

<u>**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**</u>

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 වගන්තිය | 1,917,946 | සභාව සතු කඩකාමර කුලියට දීමෙන් සහ වාර්ෂික ටෙන්ඩර් දේපළ වෙනුවෙන් ලැබිය යුතු කුලී මුදල් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 392/9 දරන 1986 මාර්තු 10 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය සහ නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 1985 මාර්තු 20 දිනැති අංක 08/01/38 දරන චක්‍රලේඛය. | - | ඕනෑම සංවර්ධන කටයුත්තක් ආරම්භ කිරීමට පෙර ඒ සඳහා පළාත් පාලන ආයතනයේ අනුමැතිය ලබාගැනීම සිදුකළ යුතු වුවද, එවැනි අනුමැතියක් නොලබා බලප්‍රදේශයේ ඉදිකිරීම් 44ක් සිදුකර තිබුණි. |
| (ඇ) 1980 අංක 47 දරන ජාතික පරිසර පනතේ 23 වගන්ති නියමය යටතේ අංක 1533/16 දරන 2008 ජනවාරි 23 දිනැති ගැසට් පත්‍රය | 140,000 | ඉකුත් වර්ෂවලදී සභාව විසින් නිකුත්කර වලංගු කාලය ඉක්මවූ බලපත්‍ර 35ක් අලුත්කර ගාස්තු අයකිරීමට කටයුතුකර නොතිබුණි. |
| (ඈ) 2015 ජූලි 10 දිනැති 02/2015 අංක දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 වගන්තිය | - | භාවිතයට නොගන්නා වත්කම් 2015 ඔක්තෝබර් 10 දිනට පෙර අපහරණය කිරීමට කටයුතු කළයුතු වුවද භාවිතයට නොගන්නා අත් ට්‍රැක්ටරයක් සම්බන්ධයෙන් එසේ කටයුතුකර නොතිබුණි. |

**02. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.16,231,263ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.12,010,379ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කල ආදායම්,රැස්කල ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 60,000 | 51,620 | 51,620 | - | 60,000 | 41,000 | 41,000 | - |
| (ii) | කුලී | 11,626,300 | 11,627,700 | 9,709,754 | 1,917,946 | 9,487,350 | 8,142,179 | 6,202,833 | 1,939,346 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,426,523 | 1,718,949 | 1,718,949 | - | 1,202,000 | 1,134,989 | 1,134,989 | - |
| (iv) | වෙනත් ආදායම් | 13,292,038 | 22,468,760 | 9,773,678 | 12,695,082 | 14,484,620 | 17,785,870 | 7,043,069 | 10,742,801 |
| | **එකතුව** | **26,404,861** | **35,867,029** | **21,254,001** | **14,613,028** | **25,233,970** | **27,104,038** | **14,421,891** | **12,682,147** |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ බිල්කරන ලද රුපියල් මිලියන 35.9ක් වූ මුළු ආදායමින් වර්ෂය අවසානවන විට රුපියල් මිලියන 21.3ක් රැස්කර තිබුණු අතර එය මුළු බිල්කළ වටිනාකමින් සියයට 59ක් තරම් අඩු අගයක පැවතුණි.

### 2.2.3 වරිපනම්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1090/05 දරන 1999 ජූලි මස 26 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් තණමල්විල ප්‍රාදේශීය සභා බලප්‍රදේශය නාගරික සංවර්ධන බලප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත්කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය වන විටද වරිපනම් ඒකක හඳුනාගෙන වරිපනම් බදු අයකිරීමට කටයුතුකර නොතිබුණි.

### 2.2.4 කුලී

(අ) තණමල්විල, මොරකැටිය හා ඩංඩුම පිහිටි කඩකාමර 22කින් වර්ෂ ගණනාවක සිට අයනොවී පවතින රු.921,550ක හිඟකඩ කුලී සමාලෝචිත වර්ෂයේදීද අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂවලදී ටෙන්ඩර්මත බදු දුන් දේපළවලින් අයවිය යුතු රු.918,297ක හිඟ බදු සමාලෝචිත වර්ෂයේදීද අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

### 2.2.5 වෙනත් ආදායම්

(අ) සභාව සතු මෝටර් ග්‍රේඩරය හා ගල් රෝල කුලියට දීමෙන් වර්ෂ ගණනාවක සිට අයනොවී පවතින රු.530,149ක් හා සමාලෝචිත වර්ෂයට අදාලව අයවිය යුතු රු.1,808,248ක් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ආ) සභාව මගින් ක්‍රියාත්මකවන ආනන්දගම හා නෙළුම්වැව ජල යෝජනා ක්‍රම 02කට අදාලව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.388,475ක හිඟ ජල ගාස්තු අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

## 2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.9,134,919ක් හා මුද්දර ගාස්තු රු. 693,259ක් විය.

## 2.3 අධිභාර

ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂයන් තුල පැනවූ අධිභාර වෙනුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට රු.378,754ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **අතුරු ව්‍යවස්ථා**

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දිනවන විටත් කාරණා 05ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) **ක්‍රියාකාරී සැලැස්ම**

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබූ කර්තව්‍යයන් තීරණයකර තිබුණද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙලකර නොතිබුණි.

(ඇ) **ඝනඅපද්‍රව්‍ය කළමනාකරණය**

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1816/43 දරන 2013 ජුනි 28 දින ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කරන ලද ඌව පළාත් සභා අතුරු ව්‍යවස්ථාව වැලඳ ගැනීමට කටයුතුකර තිබුණද, එහි 13 වන කොටසේ 2 වන වගන්තිය ප්‍රකාර කසළ බදු පනවා සමාලෝචිත වර්ෂයේදී දරා තිබුණු කසළ කළමනාකරණ වියදම පියවාගැනීමට කටයුතුකර නොතිබුණි.

(ii) සෙවනගල හා තණමල්විල නගරයෙන් දෛනිකව එකතුවන කසළවලින් නොදිරන ද්‍රව්‍ය අවිධිමත් ලෙස බැහැර කර තිබුණු නිසා ඩෙංගු වැනි වසංගත රෝග බෝවීමේ අවදානමක් පැවතුණි.

(iii) අංක 1533/16 දරන 2008 ජනවාරි 25 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව තණමල්විල හා සෙවනගල කොම්පෝස්ට් අංගන හා කසළ බැහැර කරන ඉඩම් සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් අදාල බලපත්‍ර ලබා ගැනීමට කටයුතුකර නොතිබුණි.

**(ඇ) <u>තිරසාර සංවර්ධන ඉලක්ක</u>**

තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහාවන ගෝලීය දර්ශක තුළින් සභා බලප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහාවන දිගුකාලීන සැලසුම් 2018 මැයි 23 දින වනවිටත් සකස්කර නොතිබුණි.

## 3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

(අ) පුරනැගුම ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද නව ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලෙහි පුස්තකාලය සඳහා වෙන්කර තිබුණු වර්ග අඩි 1128ක කාමරය සහ රු.760,400ක උපකරණ ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ආ) සභාව විසින් 2014,2015 සහ 2016 වර්ෂවල අනුමතකර තිබුණු ගොඩනැගිලි සැලසුම් 60ක් පරීක්ෂාකර අනුකූලතා සහතික නිකුත් කිරීමට කටයුතුකර නොතිබුණි.

(ඇ) ක්‍රියාකාරී මට්ටමේ නොපවතින පුස්තකාල 15ක පැවති රු.522,418ක් වටිනා පොත් 3044ක් හා රු.210,000ක් වටිනා පොත් රාක්ක 28ක් නැවත සභාව වෙත ලබාගෙන නොතිබුණි.

## 3.3 <u>වත්කම් කළමනාකරණය</u>

### 3.3.1 <u>පවරා නොගත් වත්කම්</u>

සුසානභූමි 98ක් පවරාගැනීමට කටයුතුකර නොතිබුණි.

## 3.4 <u>ප්‍රසම්පාදනය</u>

### 3.4.1 <u>ප්‍රසම්පාදන සැලැස්ම</u>

ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස්කර නොතිබුණි.

## 04. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රාදේශීය සභාවේ අයවැයගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස උපයෝගීකරගෙන නොතිබුණි.

### 4.2 විගණන හා කළමනාකරණ කමිටු

සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් ප්‍රමාණවත් පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතුකර නොතිබුණි.

## 05. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | වත්කම් | (i) | ලේඛනගත නොකිරීම |
| | | (ii) | ඉඩම් පවරා ගැනීමට කටයුතු නොකිරීම |
| (ආ) | ව්‍යාපෘති | | ප්‍රමාණවත් අධීක්ෂණයක් නොමැතිවීම |